Australian Government

COVID-19 VACCINATION

# ඔබගේ කෝවිඩ්-19 ස්පයික්වැක්ස් (මොඩර්නා) (Spikevax) (Moderna)

අවසන් වරට යාවත්කාලීන කළේ: 2021 සැප්තැම්බර් 2

## එන්නත සම්බන්ධව

ඔබ අද **Spikevax (Moderna)** එන්නත ලබා ගන්නා ලදී.

මෙම එන්නත මගින් ඔබට COVID-19 මගින් අසනීපවීම වළක්වා ගත හැකිය. Moderna COVID-19 එන්නතෙහි කිසිදු සජීවී වයිරසයක් අඩංගු නොවේ, එස්ම ඒ මගින් ඔබට ආසාදනය ඇතිකල නොහැක. එහි අඩංගු වන්නේ ස්පයික් ප්‍රෝටීන් ලෙස හැඳින්වෙන SARS-CoV-2 වයිරසයේ වැදගත් අංගයක් වන ජාන කේතයයි. එන්නත ලබා ගැනීමෙන් පසු, ඔබගේ සිරුර මගින් ස්පයික් ප්‍රෝටීනයේ පිටපත් සකස් කරයි. ඔබගේ ප්‍රතිශක්තිකරණ පද්ධතිය ඒ මගින් SARS-CoV-2 වයිරසය හඳුනාගෙන එයට විරුද්ධව සටන් කිරීමට ඉගෙන ගනී. සිරුර මගින් ජාන කේතය වේගයෙන් බිඳ දමයි.

## එන්නත ලබා ගැනීමෙන් පසු කුමක් බලාපොරොත්තු විය හැකිද

ඕනෑම එන්නතක් මෙන්, COVID-19 එන්නත ලබා ගැනීමෙන් පසුවද සමහර අතුරු ආබාධ ඇතිවිය හැකිය.

**Moderna** හි බහුල තුරු ආබාධ අතර පහත ඒවා ඇත:

- එන්නත් කල ප්‍රදේශයේ වේදනාව
- වෙහෙසකර ගතිය
- හිසරදය
- මාංශ පේශි රුදාව
- උණ සහ ශීතල බව
- හන්දිපත් රුදාව.

**Moderna** ලබා ගැනීමෙන් පසු ඇතිවිය හැකි **විරළ** අතුරු ආබාධ අතර පහත ඒවා ඇත:

- එන්නත් කල ප්‍රදේශයේ රත් පැහැ බව හෝ ඉදිමුවක්
- අත යට ඉදිමුවක් හෝ මොළොක් බව
- ඔක්කාරය/වමනය
- ඉදිමුණු වසා ගැටිති.

මෙම අතුරු ආබාධ සාමාන්‍යයෙන් සරල අතර දින දෙක තුනකදී නැතිව යයි. වෙනත් බහුල එන්නත් සමඟ සැසඳීමේ දී සමහර අය තුල සැලකිය යුතු ආකාරයේ උණ-සෙම්ප්‍රතිශ්‍යා ආකාර රෝග ලක්ෂණ ඇතිවිය හැකි අතර සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් බැහැරව සිටීමට සිදුවිය හැකිය. මෙම රෝග ලක්ෂණ ඕනෑම මාත්‍රාවකට පසුව ඇතිවිය හැකි අතර සාමාන්‍යයෙන් වඩා බහුල වන්නේ දෙවන මාත්‍රාවට පසුවයි.

එන්නත ලබා ගැනීමෙන් පසුව එන්නත් කල ප්‍රදේශයේ වේදනාව හෝ හිසරදය හෝ සිරුරේ වේදනා ඇතිනම්, ඔබ විසින් පැරසිටමෝල් හෝ අයිබියොප්‍රොෆීන් ලබා ගත හැකිය. මේ මගින් රෝග ලක්ෂණවලින් සමහරක් අඩු වීමට උපකාරවේ. එන්නත ලබා ගැනීමට පෙර පැරසිටමෝල් හෝ අයිබියොප්‍රොෆීන් ලබා ගැනීම අවශ්‍ය නැත. එන්නත් කල ප්‍රදේශයේ ඉදිමුවක් ඇතිනම්, ඔබ විසින් ශීත කොම්ප්‍රෙසයක් (cold compress) භාවිතා කල හැකිය.

**Moderna** ලබා ගැනීමෙන් පසු වාර්තා වී ඇති විරළ අතුරු ආබාධ පහත දැක්වේ:

- දරුණු අසාත්මික ප්‍රතික්‍රියා (ඇනෆිලැක්සිස්).
- මයෝකාර්ඩයිටිස් (හෘද පේශිවල දාහය)සහ පෙරිකාඩයිටිස් (හෘද වස්තුවේ පිටත දාරයේ දාහය). මෙම ආසාදන බොහෝමයක් ඉතා අඩු මට්ටමේ තිබෙන අතර ඉතා ක්මණින් සුවවේ. කෙසේ වුවද, මෙම ආසාදන සම්බන්ධයෙන් දිගින් දිගටම පසු විපරම් සිදු කරයි. බොහෝ ආසාදන ඇතිවන්නේ වැඩි වශයෙන් දෙවන මාත්‍රාවට පසුව වන අතර වැඩිපුරම තරුණ පිරිමි අය (වයස අවුරුදු < 30).

පහත අවස්ථාවල එන්නත ලබා ගැනීමෙන් පසු වෛද්‍ය උපකාර ලබා ගත යුතුය:

- ඔබට අසාත්මික ප්‍රතිචාරයක් ඇතිවන බව ඔබට සිතෙයි නම්. හුස්ම ගැනීමේ අපහසුව, වීසින්ග්, වේගවත් ලෙස හෘද ස්පන්දනය හෝ කඩා වැටීමක් වැනි දරුණු රෝග ලක්ෂණ ඇතිනම්, 000 අමතන්න
- ඔබට පපුවේ වේදනාව, පීඩනය හෝ අපහසුබව, අවිධිමත් හෘද ස්පන්දනය, ස්පනදනය මග හැරීම හෝ හදවත සැලෙන බව, ක්ලාන්ත ගතිය, හුස්ම කෙටිවීම, හුස්ම ගන්නා විට වේදනාව ඇතිනම්
- ඇතිවිය හැකි අතුරු ආබාධයක් සම්බන්ධයෙන් ඔබ කනස්සල්ලට පත්වී ඇතිනම් හෝ නව හෝ අනපේක්ෂිත රෝග ලක්ෂණ ඇතිනම්
- එන්නත හේතුවෙන් බලාපොරොත්තුවූ අතරු ආබාධයක් ඇතිවුණු අතර දින කිහිපයකට පසුවද එය පහව ගියේ නැතිනම්.

හදිසි නොවන රෝග ලක්ෂණ සම්බන්ධයෙන් ඔබගේ සාමාන්‍ය සෞඛ්‍යය රැකවරණ සපයන්නා හමුවන්න (සාමාන්‍යයෙන් ඔබගේ සාමාන්‍ය වෛද්‍යවරයා).

## එන්නත්වල ආරක්ෂාකාරී බව නියාමනය කිරීම සහ අතුරු ආබාධ වාර්තා කිරීම

සැක සහිත අතුරු ආබාධ සම්බන්ධයෙන් ඔබගේ එන්නත් සපයන්නා හෝ වෙනත් සෞඛ්‍යය රැකවරණ වෘත්තිකයන් හට වාර්තා කල හැකිය. ඔවුන් විසින් ඒ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රාන්ත හෝ ටෙරිටරි සෞඛ්‍යය දෙපාර්තමේන්තුව වෙත හෝ කෙළින්ම ප්‍රතිකාරක භාණ්ඩ පරිපාලනය (Therapeutic Goods Administration (TGA)) වෙත හෝ විධිමත් වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

ඒ සම්බන්ධයෙන් ඔබ විසින්ම වාර්තාවක් ඉදිරිපත කිරීමට මනාප අවස්ථාවල, TGA වෙබ් අඩවියේ කෝවිඩ්-19 එන්නත ආශ්‍රිත සැක සහිත අතුරු ආබාධ වාර්තා කිරීමේ වෙබ් අඩවිය වෙත පිවිස එහි ඇති උපදෙස් අනුගමනය කරන්න.

## එන්නතට පසු COVID-19 සම්බන්ධ පරීක්ෂා සිදු කිරීම

COVID-19 එන්නතෙහි සමහරක් අතුරු ආබාධ COVID-19 ආසාදනයේ රෝග ලක්ෂණ හා සමාන විය හැකිය (උදා. උණ). කෙසේවුවද, කෝවිඩ්-19 Moderna එන්නතෙහි කිසිදු ජීවී වයිරසයක් අඩංගු නොවන අතර ඔබට COVID-19 ආසාදනය ඇතිකල නොහැක. ඔබ විසින් පහත අවස්ථාවල COVID-19 පරීක්ෂණයක් කරවා ගැනීම හෝ හුදෙකලාවීම අවශ්‍ය නොවේ:

- එන්නත ලබා ගෙන පළමු දින දෙකෙහිදී උණ, හිසරදය හෝ වෙහෙසකර බව වැනි සාමාන්‍ය රෝග ලක්ෂණ ඇතිවීම, සහ
- කිසිදු ශ්වසන රෝග ලක්ෂණ (උදා: සොටු ගැලීම, කැස්ස, උගුරේ ආසාදන, ගඳ සුවඳ හෝ රස නොදැනීම) නොමැති බවට ඔබට විශ්වාස නම්.

කෙසේ වුවද, ඔබගේ ප්‍රාන්තයේ/ටෙරිටරියේ ඇති වඩාත්ම යාවත්කාලීන මාර්ගෝපදේශ පරීක්ෂා කල යුතුය. ඔබගේ ප්‍රදේශයේ COVID-19 පැතිරීමක් ඇතිනම්, මෙම උපදෙස් වෙනස් විය හැකිය. කෙසේ වුවද, ඔබ වෙනත් නිර්නායකයන් සපුරාලන්නේ නම්, උදා. ඔබ COVID-19 ආසාදිතයෙකු හා සමීපව සම්බන්ධවුණු අයෙකු නම්, ඔබ විසින් COVID-19 පරීක්ෂණයක් කර ගත යුතුය. සැකයක් ඇතිනම්, වෛද්‍ය උපදෙස් ලබා ගන්න.

## ඔබගේ දෙවෙනි හමුවීම අමතක නොකරන්න

Moderna එන්නතින් මාත්‍රා දෙකක් ලබා ගැනීම වැදගත්වේ. මෙම මාත්‍රා සාමාන්‍යයෙන් සති 4-6 අතර කාල පරතරයක් ඇතිව ලබා දුන්නද, විශේෂ අවස්ථානුගත කරුණු යටතේ වඩ වැඩි කාලාන්තර ඇතිව ලබා දීම නිර්දේශ කරයි. දෙවන මාත්‍රාව මගින් COVID-19 ට එරෙහිව ඇති ආරක්ෂාව දීර්ඝ කිරීමට බොහෝ ඉඩකඩ ඇත.

## හමුවීමේදී ඔබ ලබා දෙන තොරතුරු උපයෝගී කර ගන්නා ආකාරය

ඔබගේ පුද්ගලික තොරතුරු රැස් කරන, තැන්පත් කර තබන සහ භාවිතා කරන ආකාරය සම්බන්ධ වැඩිදුර විස්තර සඳහා https://www.health.gov.au/using-our-websites/privacy/privacy-notice-for-covid-19-vaccinations වෙබ් අඩවිය වෙත පිවිසෙන්න.